# මොරටුව මහා නගර සභාව

# 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

මෙහි පහත සඳහන් ද්‍රව්‍ය හා සේවාවන් සපයන බස්නාහිර පළාත තුළ ව්‍යාපාර කටයුතු කරන සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් එවන ලිපි කවරයෙහි වම්පස ඉහළ කෙළවරේ **"සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026"** යනුවෙන් පැහැදිලිව සඳහන් කර 2025.12.09 වන දින ප.ව. 3.00 ට හෝ ඊට පෙර **"නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය හැකිය.

| අනු අංකය | ද්‍රව්‍ය හා උපකරණ |
|---|---|
| 1. | කාර්යාලයීය ලිපි ද්‍රව්‍ය (පරිගණක කඩදාසි හා අභ්‍යාස පොත් ඇතුලුව) |
| 2. | මුද්‍රණ කටයුතු (මුද්‍රිත පෝරම සහ පොත්පත්,ලේඛන ආදිය) |
| 3. | පුස්තකාල පොත්, සඟරා, පුවත්පත් |
| 4. | රබර් මුද්‍රා, දින මුද්‍රා |
| 5. | වාහන සහ සත්ත්ව බලපත්‍ර තහඩු |
| 6 | දැන්වීම් පුවරු, නාම පුවරු, කටවුට්, බැනර්, ස්ටිකර් මුද්‍රණය |
| 7. | නිල ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි වර්ග |
| 8. | වැහි කබා, ගම් බූට්ස්, සපත්තු, ආරක්ෂිත සපත්තු, මේස් ආදිය |
| 9. | ඔක්සිජන් / ඇසිටලින් වායුවර්ග හා එල්.පී.ගෑස් ඇතුළු ද්‍රව්‍ය සැපයීම |
| 10. | පවිත්‍රතා කටයුතු ආශ්‍රිත ද්‍රව්‍ය හා උපකරණ (ඉදල්, කොසු, බුරුසු, පාපිසි, වේවැල් කුඩ, ප්ලාස්ටික් කුණු කුඩ, විම්, හාපික්, සබන් වර්ග, පයිනෝල්, ලයිසෝල්, රබර් අත්වැසුම්, ටෝච් බැටරි, පොලිතීන් මලු ආදිය) |
| 11 | රසායනාගාර සායනික යන්ත්‍ර උපකරණ සැපයීම |
| 12. | රසායනාගාර සායනික ද්‍රව්‍ය සැපයීම |
| 13 | විෂබීජනාශක ද්‍රව්‍ය, මුව ආවරණ, අත්වැසුම් ආදිය |
| 14. | පැළ වර්ග, පොහොර, තෙල් ඇතුලු උද්‍යාන අලංකරණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය |
| 15. | ඉන්ධන මඟින් ක්‍රියා කරන යන්ත්‍ර සහ උපාංග ආදීය (ධූමායන යන්ත්‍ර, තණකොළ කපන යන්ත්‍ර) සැපයීම හා අලුත්වැඩියාව |
| 16. | කාර්යාල උපකරණ– ලී, වානේ, ප්ලාස්ටික් ගෘහ භාණ්ඩ (ලිපිගොනු රාක්ක, අල්මාරි, මේස, පුටු, කැබිනට් ආදිය) |
| 17. | විදුලි උපකරණ (මුදල් ගණන් කිරීමේ යන්ත්‍ර, එකතු කිරීමේ යන්ත්‍ර, විදුලි පංකා, විදුලි කේතල සහ වතුර මෝටර ආදිය) |
| 18. | වායුසමීකරණ යන්ත්‍ර සැපයීම |
| 19. | වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව, නඩත්තු හා සේවා සිදු කිරීම |
| 20. | පැමිණීම සටහන් කිරීමේ යන්ත්‍ර සහ CCTV කැමරා හා උපාංග සැපයීම හා සේවා සිදු කිරීම |
| 21. | පරිගණක හා ඒ ආශ්‍රිත උපාංග සැපයීම |
| 22. | පරිගණක යන්ත්‍ර, අලුත්වැඩියා කිරීම |
| 23. | පරිගණක මෘදුකාංග සකස් කර සැපයීම |
| 24. | පරිගණක ජාල ස්ථාපනය හා නඩත්තුව |
| 25. | මුද්‍රණ යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ අනු පිටපත් යන්ත්‍ර සැපයීම |
| 26. | මුද්‍රණ යන්ත්‍ර, ෆොටෝකොපි යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, අනුපිටපත් යන්ත්‍ර අලුත්වැඩියා හා සේවා කිරීම |
| 27. | මුද්‍රණ යන්ත්‍ර සඳහා ටෝනර්, රිබන් සැපයීම |
| 28. | විදුලි සේවාවන්, සැපයීමට අවශ්‍ය උපාංග හා ද්‍රව්‍ය (වයර් , ස්විච් , බල්බ් , ප්ලග් ආදිය හා වීථි පහන් උපකරණ) |
| 29. | සූර්යබල පද්ධති ස්ථාපනය හා නඩත්තුව |
| 30. | ගිනි නිවන උපකරණ කට්ටල, ගිනි නිවීම් ද්‍රව්‍ය, ගිනි නිවීම් ආරක්ෂිත ඇඳුම් |
| 31. | පෙර පාසල් උපකරණ හා සියලු වර්ගයේ ක්‍රීඩා උපකරණ |
| 32. | ටයර්, ටියුබ්, රිම්ටේප් හා ඊට ආශ්‍රිත ද්‍රව්‍ය සැපයීම |
| 33. | වාහන බැටරි සැපයීම (මොරටුව බල ප්‍රදේශයේ සැපයුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ) |
| 34. | වාහන අලුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් සැපයීම<br>i. යතුරු පැදි ත්‍රිරෝද රථ<br>ii. සියලුම වර්ගයේ රෝද 2 ට්‍රැක්ටර් හා රෝද 4 ට්‍රැක්ටර් රථ |
| 35. | මාර්ග තලන, බැකෝ යන්ත්‍ර, එස්කැවේටර් යන්ත්‍ර හා ස්කිඩ් යන්ත්‍ර ඇතුළු යන්ත්‍ර අලුත්වැඩියාව |
| 36. | කැබ් රථ, ටිපර් රථ, ලොරි රථ ඇතුළු සියලුම වර්ගයේ රථ වාහන අලුත්වැඩියාවට අවශ්‍ය අමතර කොටස් |
| 37. | සියලුම වාහන හා යන්ත්‍ර උපකරණ වල ටිංකර් අලුත්වැඩියාවන් හා පින්තාරු කටයුතු ඉටුකිරීම |
| 38. | සියලුම වාහන, යන්ත්‍ර මාදිලිවල වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියාව |
| 39. | වාහන හා යන්ත්‍රවල සීට් අලුත්වැඩියාව, කාපට් යෙදීම හා අපොස්ටින් අලුත්වැඩියාව |
| 40. | වාහන හා යන්ත්‍රවල සයිලන්සර් පද්ධති අලුත්වැඩියාව |
| 41. | වාහන වල එන්ජින් අලුත්වැඩියාවට අදාළ පට්ටල් කාර්යයන් හා වාහන යන්ත්‍ර කොටස් අලුත්වැඩියාවට අදාළ පට්ටල් කාර්යයන් |
| 42. | වාහන අලුත්වැඩියාවන් සඳහා අවශ්‍ය වන විදුලි ද්‍රව්‍ය සැපයීම |
| 43. | කේබල් හා හෝස් වර්ග අලුත්වැඩියාව |
| 44. | මලනොබැදෙන තීන්ත වර්ග හා වාහන පින්තාරුවට අවශ්‍ය සියළුම ද්‍රව්‍ය සැපයීම |
| 45. | වාහන සඳහා ලිහිසි තෙල් හා ග්‍රීස් ආදිය ලබාගැනීම |
| 46. | මගී වාහන සේදීම ඇතුළු සේවාවන් සිදුකිරීම |
| 47. | කැබ් රථ, ට්‍රැක්ටර් රථ, ටිපර් රථ ඇතුළු වාහන අලුත්වැඩියාව |
| 48. | සියළුම වර්ගයේ යකඩ නිමදුම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා උපකරණ සැපයීම |
| 49. | ට්‍රැක්ටර්, මගී ප්‍රවාහන , ටිපර් රථ, කොම්පැක්ටර් රථ, ගලි බවුසර්, ගස් කපන යන්ත්‍ර සහ හදිසි අවශ්‍යතාවයන් සඳහා අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ ආදී වාහන කුලියට සැපයීම |
| 50. | මගී ප්‍රවාහන, ඉදිකිරීම් ද්‍රව්‍ය ප්‍රවාහනය ඇතුලු ප්‍රවාහන සේවා සැපයීම |
| 51. | මෝටර් ග්‍රේඩර්, බැකෝ යන්ත්‍ර , මාර්ග නඩත්තු සඳහා අවශ්‍ය සේවා සැපයීම |
| 52. | ඇලුමිනියම් ආශ්‍රිත ද්‍රව්‍ය සැපයීම |
| 53. | ගොඩනැගිලි ද්‍රව්‍ය (සිමෙන්ති, මැටි, ගඩොල්, ගංගා වැලි, මුහුදු වැලි, පස්, කලුගල්, (1/4" –1" ½) බොරළු, ABC ඇතුලු මාර්ග නඩත්තුවට අදාළ ද්‍රව්‍ය ආදිය) |
| 54. | ගොඩනැගිලි ඉදිකිරීම් ආශ්‍රිත උපකරණ (ඉනිමං, ග්‍රිල්, හැමර්, බුරුසු, සවල්, උදළු, රේක්ක, විල් බැරෝ, ගල් කටු, කපන කටු, කියත්, තාර බාල්දි) |
| 55. | හියුම් පයිප්ප සහ කොන්ක්‍රීට් කණු, මායිම් ගල්, ඉන්ටර්ලොක්, සිමෙන්ති බ්ලොක් ගල් කොන්ක්‍රීට් ආශ්‍රිත භාණ්ඩ සහ කොන්ක්‍රීට් මිශ්‍රණ |
| 56. | ටයිල්, ග්‍රැනයිට්, ටයිටේනියම් සහ ඒ ආශ්‍රිත ද්‍රව්‍ය |
| 57. | වීදුරු හා වීදුරු භාණ්ඩ, වීදුරු නිෂ්පාදන |
| 58. | පී.වී.සී. උපකරණ, ජී.අයි. ජල නළ උපාංග යනාදී භාණ්ඩ සහ අමතර කොටස්, ප්ලාස්ටික් ජල ටැංකි, සනීපාරක්ෂක අමතර කොටස්, කොම්පොස්ට් බැරල් |
| 59. | දැව සැපයීම (ලෑලි , පරාල, රීප්ප ආදිය) |
| 60. | තාර හා කෝලාස් , ප්‍රිමික්ස් |
| 61. | පුටු විවීම, අලුත්වැඩියාව, කුෂන් කිරීම |
| 62. | නිල ඇඳුම් මැසීම |
| 63. | විදුලි ජනන යන්ත්‍ර සැපයීම සහ අලුත්වැඩියාව |
| 64. | අභ්‍යන්තර දුරකථන පද්ධතිය සැපයීම සහ දුරකථන මාර්ග අලුත්වැඩියා කිරීම |
| 65. | උත්සව භාණ්ඩ සහ උපකරණ, ශබ්ද විකාශන පද්ධති සැපයීම – ආයතනය අවට සැපයුම්කරුවන් විය යුතුය |
| 66. | ගස් කැපීම |
| 67. | ආදාහනාගාර අලුත්වැඩියාව |
| 68. | පළිබෝධ මර්දනය (මීයන්, වේයන්, කැරපොත්තන් වැනි) |
| 69. | භාෂා පරිවර්තක සේවා සැපයීම |
| 70. | නීතිඥ සේවාවන් සැපයීම |
| 71. | බලයලත් මිනින්දෝරු සේවාවන් |
| 72. | පශු වෛද්‍ය සේවාවන් – සත්ත්ව වන්ද්‍යකරණය ආදී |
| 73. | පශු වෛද්‍ය උපකරණ (සුනඛයින් සඳහා කරපටි, Squeeze Cage , කන කපන යන්ත්‍ර ආදිය.) |
| 74. | වරලත් විදුලි ඉංජිනේරු සේවාවන් (උපදේශන සේවාවන්) |
| 75. | ශ්‍රම සැපයුම් |
| 76. | උද්‍යාන අලංකරණ |
| 77. | බල මෙවලම් උපකරණ සැපයීම හා නඩත්තුව |
| 78. | වරලත් ව්‍යුහාත්මක ඉංජිනේරු සේවාවන් |
| 79. | වරලත් ගෘහනිර්මාණ ශිල්පී සේවාවන් |

සභාව මඟින් නිකුත් කරනු ලබන කොන්දේසි සහ නිර්ණායක සහිත විස්තර පත්‍රිකාව හා අයදුම්පත **www.moratuwa.mc.gov.lk** වෙබ් අඩවියට පිවිස ලබාගත හැකි අතර **itu.moratuwamc@gmail.com** විද්‍යුත් තැපැල වෙත ඉල්ලීමක් කර ලබාගැනීම හෝ කාර්යාලයට පැමිණ නොමිලේ පරීක්ෂා කර බලා ලබාගත හැකිය. එකී කොන්දේසි සපුරාලිය හැකි සැපයුම්කරුවන් පමණක් ලියාපදිංචිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. එක් භාණ්ඩ/ සේවා කාණ්ඩයක් සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තුව රු. 3,000.00 ක් සහ VAT සහිත සම්පූර්ණ මුදල = රු. 3,540.00 කි. එම ලියාපදිංචි ගාස්තු කාර්යාල දිනවල, පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මෙම කාර්යාලයේ සරප් වෙත ගෙවා රිසිට්පතක් ලබා ගැනීමෙන් හෝ **"නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව"** යන නමට චෙක්පතක් එවීමෙන් ගෙවීම් කළ හැක.

**එල්.පී.මනෝජා එස්.පතිරණ**
**නාගරික කොමසාරිස්,**
**මොරටුව මහා නගර සභාව.**

**2025.11.25**
**මොරටුව මහා නගර සභා කාර්යාලයේදීය.**
**දු.ක.011-2645251**

## මොරටුව මහා නගර සභාවේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2026

### කොන්දේසි

1. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වූ අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ 2025.12.09 දින ප.ව.3.00 දක්වා පමණි.
2. ලියාපදිංචි වීම සඳහා සැපයුම්කරුවන් විසින් තමන් ලියාපදිංචි වීමට අපේක්ෂිත භාණ්ඩ/ සේවා කාණ්ඩ හා ඊට අදාළ කාණ්ඩ අංකද සඳහන් කර නිසි පරිදි සම්පූර්ණ කළ අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු අතර, එක් එක් අයිතමයන් සඳහා වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුයි.
3. ඉහත සඳහන් එක් කාණ්ඩයකට අදාළව සැපයුම්කරුවකු ලෙස ලියාපදිංචි වීමට ගෙවිය යුතු ගාස්තුව රු. 3,000.00 + 540.00 (VAT) = රු. 3,540.00 ක් වේ. කාණ්ඩ කිහිපයක් සඳහා ලියාපදිංචි වීමට අදහස් කරන්නේ නම් එක් කාණ්ඩයකට රු. 3,540.00 බැගින් වන පරිදි ගෙවිය යුතුවේ. එම මුදල කාර්යාල දිනවලදී, පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා මෙම කාර්යාලයේ සරප් වෙත ගෙවා රිසිට්පතක් ලබා ගැනීමෙන් හෝ "නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව" යන නමට චෙක්පතක් එවීමෙන් ගෙවීම් කළ හැක.
4. 2026 වර්ෂය තුළ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් සාමාන්‍ය මිල ගණන් කැඳවීම් කරනු ලබන අතර, ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සාමාන්‍යයෙන් **මාස හයක (06) කාලයක් තුළ වෙනස් නොකරන ස්ථාවර තත්වයක තබා ගැනීම කළ යුතුය**. අවශ්‍ය යැයි හැඟෙන අවස්ථාවලදී ලියාපදිංචි සැපයුම්කරුවන්ට පරිබාහිරව වෙනත් සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ හා සේවාවන් සඳහා මිල ගණන් ලබා ගැනීම ඒ අනුව භාණ්ඩ හා සේවාවන් ලබාගැනීමේ අයිතිය සභාව සතුව පවතී.
5. සැපයුම්කරුවන් අප වෙනුවෙන් තොග තබා ගත යුතු අතර, මොරටුව මහා නගර සභාවේ ලියාපදිංචි වන විට **දින 60ක** ණය පහසුකම් ලබා දීමට සියලුම සැපයුම්කරුවන් එකගතාවය පළ කළ යුතුය.
6. ඇණවුම් කරන භාණ්ඩ සභාවේ ගබඩාව වෙත ගෙනවිත් භාරදිය යුතුයි. ඒ සඳහා ගාස්තු ගෙවනු නොලැබේ.
7. 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම පිළිබඳ අවසාන තීරණය ගැනීමේ අයිතිය සභාව සතුවේ.

### මොරටුව මහා නගර සභාවේ ලියාපදිංචි වන සැපයුම්කරුවන් සඳහා තිබිය යුතු නිර්ණායක

1. අයදුම්පත සමඟ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
2. එකතු කළ අගය මත බදු ගෙවීම් කරන්නේ නම් ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
3. වාහන අලුත්වැඩියා සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභාවේ අනුමත මෝටර් ගරාජයක වීම විශේෂ සුදුසුකමක් වන අතර, රාජ්‍ය ආයතන පහකටවත් සේවා සපයා ඇති පළපුරුදු ආයතනයක් වීම.
4. මිල ගණන් කැඳවීම් සඳහා සමගාමී අවස්ථා 2කදී ප්‍රතිචාර නොදක්වන සැපයුම්කරුවන් වෙතින් තවදුරටත් මිල ගණන් කැඳවීම් සිදුකරනු නොලැබේ.
5. ඇණවුම් කළ පසු භාණ්ඩ සැපයීමට අපොහොසත් වන සැපයුම්කරුවන් සහ නියමිත ප්‍රමිතියෙන් තොරව භාණ්ඩ හා සේවා සපයනු ලබන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කොට අසාධු ලේඛනගත (Black List) කරනු ලැබේ.

**නාගරික කොමසාරිස්,**
**මොරටුව මහා නගර සභාව.**